# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/10 – 2013 නොවැම්බර් මස 20 වැනි බදාදා - 2013.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 03 දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය

2013.06.18 වැනි දින පැවති බස්නාහිර පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ 2013.10.09 වැනි දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලද බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 03 දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය 2013.10.25 වැනි දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජගත් අංගගේ,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන
හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා
හා සභා කටයුතු අමාත්‍ය (බ. ප.).

2013 ඔක්තෝබර් මස 25 වැනි දින,
අංක 175, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු,
පරිවාස හා ළමාරක්ෂක සේවා හා සභා කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 03 දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ සඳහන් "දේශීය වෛද්‍ය කටයුතු" විෂය ක්‍රියාත්මක කරමින් දේශීය වෛද්‍ය ක්‍රමය උපයෝගී කොට බස්නාහිර පළාතේ ජනතාවගේ රෝග නිවාරණය, රෝග ව්‍යුපසමනය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ දේශීය වෛද්‍ය ප්‍රජා සෞඛ්‍ය සේවා ආරම්භ කර පවත්වාගෙන යාම, දේශීය වෛද්‍ය කටයුතු ප්‍රවර්ධනය හා සංරක්ෂණය කිරීම, දේශීය වෛද්‍ය ආයතන පිහිටුවීම, පවත්වාගෙන යාම, සංවර්ධනය කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහාත්, ඔසු උයන් ආරම්භ කර පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම සඳහාත්, බස්නාහිර පළාතේ දේශීය වෛද්‍ය ආයතන හා දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම හා එම කටයුතු නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහාත්, ඊට අදාළ හා අනුෂාංගික වූ කරුණු සඳහාත්, විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තියේ විධි විධාන 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා අනනුකූල වේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 03 දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

## *I වන කොටස*

*පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම- එහි සංයුතිය හා කාර්යභාරය*

පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා බස්නාහිර පළාතේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ.

බස්නාහිර පළාත් දේශීය වෛද්‍ය කොමසාරිස් සහ කාර්ය මණ්ඩලය

3. (1) මෙහි මින් මතු "කොමසාරිස් " වශයෙන් සඳහන් කරනු ලබන "බස්නාහිර පළාත් දේශීය වෛද්‍ය කොමසාරිස් "මෙහි දෙවැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානියා වන්නේ ය.

(2) කොමසාරිස්වරයාට සහය පිණිස නියෝජ්‍ය කොමසාරිස්වරුන්, දේශීය වෛද්‍යවරුන් ඇතුළු අදාළ කාර්ය මණ්ඩලයක් සිටිය යුත්තේය.

(3) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ස්ථාන මාරු කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ වෙනත් අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේය.

දෙපාර්තමේන්තුවේ අරමුණු

4. දෙපාර්තමේන්තුවේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව එහි 154 අ ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 12 වන වගන්තිය යටතේ සඳහන් පරිදි දේශීය වෛද්‍ය රෝහල් පිහිටුවීම හා පවත්වාගෙන යාම, දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව රෝගීන්ට ප්‍රතිකාර කිරීම පිණිස අවශ්‍ය ආයතන පිහිටුවා ඵලදායී හා කාර්යක්ෂම ලෙස සේවා පවත්වා ගෙන යාම, ඒ සඳහා පහසුකම් සැපයීම සහ ආධාර හා අනුබල ලබා දීම ;

(ආ) දේශීය වෛද්‍ය ක්‍රමය අනුව බස්නාහිර පළාතේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීමෙහිලා රෝග ව්‍යුපසමනය, රෝග නිවාරණය හා සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම ;

(ඇ) දේශීය ඖෂධ පැළෑටි සංරක්ෂණය සඳහා ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඈ) ආයුර්වේද, සිද්ධ, යුනානි, දේශීය පාරම්පරික යන නාමයන්හි හෝ ඒ අනුව අර්ථ ගැන්වෙන්නා වූ කුමන හෝ බෙහෙත් ශාලාවක්, රෝහලක්, ඖෂධ අලෙවිසැලක්, සම්භාහන ආයතනයක් හෝ ඖෂධ නිෂ්පාදනාගාරයක් නියාමනය කිරීම.

දෙපාර්තමේන්තුවේ කාර්යයන්

5. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(අ) දේශීය වෛද්‍ය සේවා සපයන රෝහල්, බෙහෙත් ශාලා සහ දේශීය වෛද්‍ය ක්‍රමයන්ට අනුව රෝගීන්ට ප්‍රතිකාර කිරීම පිණිස අවශ්‍ය වෙනත් ආයතන පිහිටුවීම, එම ආයතන තුළින් ඵලදායි හා කාර්යක්ෂම දේශීය වෛද්‍ය සේවාවන් පවත්වාගෙන යාම හා නියාමනය කිරීම ;

(ආ) දේශීය වෛද්‍ය ක්‍රමය අනුව පළාතේ ජනතාවගේ සෞඛ්‍ය වර්ධනය කිරීම පිණිස සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම ;

(ඇ) රෝග සත්කාරක සේවා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඈ) දේශීය වෛද්‍ය ආයතන වල සේවය කරන කාර්ය මණ්ඩල වලට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබා දීම;

(ඉ) ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතින්ට අනුකූලව පළාත තුළ දේශීය වෛද්‍ය කටයුතු වල යෙදෙන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන,අර්ධ රාජ්‍ය ආයතන සහ රජයට සම්බන්ධ ආයතන ලියාපදිංචි කිරීම හා එම කටයුතු කර ගෙන යාමේදී අදාළ ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ, ප්‍රමිතීන් හා නිර්ණායකයන් නියම කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම ;

(ඊ) ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(උ) ඖෂධ පැළෑටි වගා කිරීමට උනන්දු කරවීම හා ඒ පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ඖෂධ නිෂ්පාදනාගාර පිහිටුවා පවත්වා ගෙන යාම හා දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලබන ආයතන සඳහා ඖෂධ බෙදා හැරීම ;

(එ) පළාතේ ජනතාවගේ ප්‍රජා සෞඛ්‍ය සේවාව පුළුල් කිරීම මගින් වසංගත රෝග පාලනය කිරීම හා හදිසි ව්‍යසන අවස්ථා වලදී සේවා සැපයීම ;

(ඒ) ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව දේශීය වෛද්‍ය සේවාවන්ට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනයට උනන්දු කරවීම හා ඒ පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) ජාතික ප්‍රතිපත්ති හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පළාතේ දේශීය වෛද්‍ය සේවා සපයනු ලබන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන, අර්ධ රාජ්‍ය ආයතන සහ රජයට සම්බන්ධ ආයතන හා ඖෂධ නිෂ්පාදනාගාර වල කටයුතු සිදු කරන්නේද යන්න පරීක්ෂා කිරීම, උපදෙස් ලබා දීම හා අනුබල දීම ;

(ඕ) පළාතේ ජනතාවගේ සෞඛ්‍යය හා එය නංවාලීම පිණිස සලසනු ලබන දේශීය වෛද්‍ය සේවාවන්ට අදාළ තොරතුරු එක්රැස් කිරීම හා ප්‍රචලිත කිරීම ;

(ක) දේශීය පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳව තොරතුරු එක් රැස් කිරීම, සංරක්ෂණය කිරීම හා වැඩි දියුණු කිරීම ;

(ග) දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පිණිස රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව සංවර්ධන කාර්යයන් සඳහා දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මුල්‍ය හෝ ද්‍රව්‍ය ආධාර ලබා ගැනීම හා/හෝ තාක්ෂණ සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ච) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාත් දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති නිර්ණය කිරීම.

6. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් දෙපාර්තමේන්තුවේ අරමුණු සපුරාගැනීමට හා එයට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ සියළු බලතල, නීතියේ සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුව සතු විය යුතුය. දෙපාර්තමේන්තුවේ බලතල

(2) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණු හා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු, ලේඛන හෝ වාර්තා කොමසාරිස් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන අයෙකු විසින් රජයේ හෝ රාජ්‍ය නොවන යම් දේශීය වෛද්‍ය ආයතනයකින් හෝ පුද්ගලයකුගෙන් හෝ ඉල්ලා සිටියහොත් එම ආයතනය හෝ පුද්ගලයා විසින් එම තොරතුරු, ලේඛන හෝ වාර්තා ලබා දීමට බැඳී සිටී.

## *II* වන කොටස

### *දේශීය වෛද්‍ය ආයතන*

7. (1) කිසිදු තැනැත්තෙකු පළාත් විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නියම කරනු ලබන දිනකදී හෝ ඊට පසු, දේශීය වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම

(අ) කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් මගින්, දේශීය වෛද්‍ය ආයතනයක් පවත්වාගෙන යාම සඳහා එකී තැනැත්තාට බලය දී ඇත්නම් මිස, සහ

(ආ) යම් පරිශ්‍රයක්, දේශීය වෛද්‍ය සේවාවන් සපයනු ලබන ආයතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා හඳුනාගත් පරිශ්‍රයක් ලෙස කොමසාරිස් වෙත තත්කාලයේ ලියාපදිංචි කර සහතිකයක් නිකුත් කර ඇත්තේ නම් මිස,

කිසිම දේශීය වෛද්‍ය ආයතනයක් පළාත තුළ පවත්වාගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම හෝ නොකළ යුතුය.

(ඇ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙර ආරම්භ කරනු ලැබ 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි කර පවත්වාගෙන යනු ලබන බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන සෑම රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක් සහ රජයට සම්බන්ධ ආයතනයක්ම මෙම ප්‍රඥප්තිය යටතේද නැවත ලියාපදිංචි විය යුතුය.

(ඈ) ලියාපදිංචිය ලිත් වර්ෂ 02 ක් සඳහා පමණක් වලංගු වේ.

*ලියාපදිංචි කරනු ලබන දේශීය වෛද්‍ය ආයතන සම්බන්ධයෙන් කොමසාරිස්ගේ බලතල හා කර්තව්‍යයන්*

(2) (අ) දේශීය වෛද්‍ය ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වු සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතිය අනුව සම්පූර්ණ කර, නියමිත ගාස්තුව සමග කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) කොමසාරිස් විසින්, ඉහත (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසු ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් සපයන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය භාර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත දැනුම් දිය යුතුය.

(ඇ) (2) උප වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කොමසාරිස්ගේ එකී දැනුම් දීමේ දිනයේ සිට දින හැටක්(60) ඇතුළත අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය භාර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් සිය නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් පළාත් කොමසාරිස් වෙත ලබා දිය යුතුය.

(ඈ) පළාත් කොමසාරිස් විසින් අදාළ නිරීක්ෂණ වාර්තාව සලකා බැලීමෙන් පසු ;

(i) දේශීය වෛද්‍ය ආයතනය ලියාපදිංචි කර, ඉල්ලුම්කරුට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කර එකී පරිශ්‍රය අදාළ දේශීය වෛද්‍ය ආයතනය පවත්වාගෙන යා යුතු පරිශ්‍රය ලෙස ලියාපදිංචි කිරීමට හෝ

(ii) ප්‍රඥප්තිය යටතේ දේශීය වෛද්‍ය ආයතන ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පනවනු ලබන රෙගුලාසි/ රීති වලට අනුකුල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කර ඒ බව ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීමට හෝ කටයුතු කළ යුතුය.

(iii) ඉහත (ii) අනු ඡේදය යටතේ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව දින හැටක් (60) ඇතුළත අදාළ ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

(ඉ) (i) ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ කොමසාරිස්ගේ තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවෙකු විසින් එකී තීරණය දැනුම් දෙනු ලැබු දින සිට දින විසි එකක් (21) ඇතුළත එකී තීරණයට විරුද්ධව ලේකම් වෙත අභියාචනය කළ හැක්කේ ය.

(ii) ලේකම් විසින් එකී අභියාචනය තමන්ට ලැබීමෙන් දින හැටක්(60)ඇතුළත තම තීරණය ඉල්ලුම්කරුට දැනුම් දිය යුතුය.

(ඊ) ලියාපදිංචි කිරීමේ ගාස්තුව පළාත් විෂයභාර අමාත්‍යවරයා විසින් පනවන රීති මගින් නියම කළ යුත්තේ ය.

8. (1) කොමසාරිස් විසින් එසේ කිරීම අවශ්‍ය යැයි සලකනු ලබන විටක, මෙම ප්‍රඥප්තිය යටතේ වු කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම, ඔහු විසින් පත් කරනු ලබන යම් නිලධාරියෙකුට හෝ යම් කමිටුවකට හෝ පැවරීම කළ හැකි අතර, එකී නිලධාරියා හෝ කමිටුව හෝ විසින් එකී කාර්යයන් සහ කර්තව්‍යයන් කොමසාරිස්ගේ සාමාන්‍ය හෝ විශේෂ විධානය යටතේ ඉටු කිරීම සිදු කළ යුතු වන්නේ ය.

(2) නීතියේ පොදු සීමාවන්ට යටත්ව කොමසාරිස්ගේ ලිඛිත අවසරය ලැබූ යම් තැනැත්තෙකු විසින්, මෙම ප්‍රඥප්තියේ 7 (2) (ඇ) ඡේදයෙහි සඳහන් කාර්යය සඳහා හා/හෝ 7 (2) (ඈ) (i) අනු ඡේදය යටතේ දේශීය වෛද්‍ය ආයතනයක් ලෙස ලියාපදිංචි කළ යම් ආයතනයක් හෝ පරිශ්‍රයක් හෝ වෙත අවශ්‍ය ඕනෑම වෙලාවක ඇතුළු වී,

(අ) එකී පරිශ්‍රය පරීක්ෂා කිරීමට ;

(ආ) එහි සිටින යම් තැනැත්තෙකු හෝ රෝගියෙකුගෙන් කරුණු විමසීමට ;

(ඇ) එය තුළ පවත්වාගෙන යන යම් ලේඛන හෝ වාර්තා හෝ පරීක්ෂා කිරීමට සහ එකී ලේඛන හෝ වාර්තාවේ පිටපත් ගැනීමට ;

(ඈ) එකී පරිශ්‍රයේ අයිතිකරුට හා/හෝ භාරව සිටින යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලබන රීති හෝ රෙගුලාසි වලට අනුව කටයුතු කිරීමට උපදෙස් හෝ නියෝග ලබා දීමට බලය ඇත්තේ ය.

9. මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීමේදී කොමසාරිස් විසින් පොලීසියේ සහය ඉල්ලා සිටියහොත් එකී සහාය පොලීසිය විසින් ලබා දිය යුතු වන්නේය.

## *III* වන කොටස

### දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන්

10. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පසු දිනයක දී එකී තැනැත්තා කොමසාරිස් වෙත තත්කාලයේ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස, බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස කිසිදු තැනැත්තෙකු කටයුතු නොකළ යුතුය.

දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම

11. (1) දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස අදාළ ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම ලිඛිතව හා නියමිත ආකාරයට, කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. එකී ඉල්ලීම නියමිත ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

(2) දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස සිදු කරනු ලැබූ යම් ලියාපදිංචි වීමක් කොමසාරිස් විසින් අවලංගු කරනු ලැබූ යම් තැනැත්තෙකුට, ලියාපදිංචි වීම සඳහා නැවත ඉල්ලුම් කළ හැක්කේ ය.

12. (1) කොමසාරිස් විසින් පහත දැක්වෙන දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන්, එනම් ;

(අ) දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කරන්නන් ;

(ආ) දේශීය වෛද්‍ය උපස්ථායක වරුන් ; සහ

(ඇ) දේශීය වෛද්‍ය පංචකර්ම ශිල්පීන් හා/හෝ සම්බාහනකරුවන් ;

ලියාපදිංචි කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් වූ ලේඛන පවත්වාගෙන යා යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලේඛන නිසියාකාරව තබා ගැනීම සහ පවත්වා ගෙන යාම කොමසාරිස්ගේ වගකීම වන්නේ ය.

13. කිසිදු තැනැත්තෙකු :-

දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි වීමටඅවශ්‍ය සුදුසුකම්

(1) ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ නම්;

(2) කොමසාරිස් විසින් පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමෙන් පසු එකී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නේ නම් ; සහ

(3) අවස්ථාවෝචිත පරිදි දේශීය වෛද්‍ය සාත්තු සේවය, දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කිරීම, දේශීය වෛද්‍ය උපස්ථානය, දේශීය වෛද්‍ය පංචකර්ම ප්‍රතිකර්මය යන වෘත්තීන්හි කාර්යයක්ෂමව නියුක්ත වීමෙහි ලා ප්‍රමාණවත් දැනුම හා පළපුරුද්ද ඇති අයෙකු බවට කොමසාරිස් සෑහීමට පත් වන්නේ නම් ද ;

මිස දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි වීමට හිමිකම් නොලබන්නේය.

දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම

14. 11(1) උප වගන්තිය යටතේ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසු ;

(1) මෙම ප්‍රඥප්තියේ හා ඒ යටතේ පනවන ලද රීති මගින් දක්වා ඇති පරිදි නියමිත සුදුසුකම් සපුරා ඇත්නම් දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි කර ඉල්ලුම්කරුට ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමට හෝ ;

(2) ප්‍රඥප්තිය යටතේ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පනවනු ලබන රීති වලට අනුකූල නොවන හා සුදුසුකම් සපුරා නොමැති ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කර ඒ බව ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීමට හෝ කටයුතු කළ යුතුය.

(3) 14 (2) උප වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව දින තිහක් (30) ඇතුළත අදාළ ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

ලියාපදිංචි කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා හේතු

15. යම් දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු එවැනි සේවා නියුක්තිකයෙකුගේ තත්වයෙන් යම් නොමනා හැසිරීමක් පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් යම් වරදකට නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් මගින් වරදකරු බවට නිගමනය කර ඇති අවස්ථාවක කොමසාරිස් විසින් එකී සේවා නියුක්තිය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කොට ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම හෝ කළ යුතු වන්නේය.

ලියාපදිංචි වූ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන්ට වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති බව

16. ලියාපදිංචිය ලැබූ සෑම දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකුටම එකී සේවා නියුක්තිකයා මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වනු ලැබුවේ යම් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ද, එකී ක්ෂේත්‍රයෙහි පළාත ඇතුළත වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇත.

17. (1) කිසිම තැනැත්තෙකු විසින්, යම් තැනැත්තෙකු අවස්ථාවෝචිත පරිදි දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කරන්නෙකු, දේශීය වෛද්‍ය උපස්ථායකවරයෙකු හෝ දේශීය වෛද්‍ය සම්බාහකවරයෙකු ලෙස තම කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ විධිමත් ලෙස ලියාපදිංචි වී සහ අවසර ලබා ගෙන ඇත්නම් මිස දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා දේශීය වෛද්‍ය ආයතනයක සේවයේ නියුක්ත කරනු නොලැබිය යුතුය.

(2) දේශීය වෛද්‍ය ආයතනයක යම් ලියාපදිංචි අයිතිකරුවෙකු විසින් එකී දේශීය වෛද්‍ය ආයතනයේ සේවයේ නියුතු සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම් සෑම තුන් මසකටම වරක් කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අභියාචනා කිරීම

18. (1) 14 (2) උප වගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ කොමසාරිස්ගේ තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවෙකු විසින් එකී තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින විසි එකක් (21) ඇතුළත එකී තීරණයට විරුද්ධව ලේකම් වෙත අභියාචනය කළ යුත්තේ ය.

(2) ලේකම් විසින් එකී අභියාචනය තමන්ට ලැබීමෙන් දින තිහක් (30) ඇතුළත තම තීරණය ඉල්ලුම්කරුට දැනුම් දිය යුතුය.

දේශීය වෛද්‍ය යටතේ ගැනෙන " ආයුර්වේද', සිද්ධ", "යුනානි", " පාරම්පරික වෛද්‍ය" පද භාවිතා කිරීම

19. (1) කිසිම තැනැත්තෙකු විසින්, ඒ සඳහා අවස්ථාවෝචිත පරිදි කොමසාරිස්ගේ ලිඛිත අවසරය ලබා ඇත්තේ නම් මිස "ආයුර්වේද", "සිද්ධ", "යුනානි", "පාරම්පරික වෛද්‍ය" යන පද භාවිතා නොකළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් "ආයුර්වේද", "සිද්ධ", "යුනානි", "පාරම්පරික වෛද්‍ය" යන පද භාවිතා කිරීම යන්නට

(අ) යම් පදවි නාමයකට හෝ නාමයකට පෙර ;

(ආ) නාම පුවරුවක් මත හෝ සංඥා පුවරුවක් මත ;

(ඇ) විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යයක් හරහා පෙන්නුම් කරන යම් වාණිජ ප්‍රචාරක දැන්වීමක හෝ ;

(ඈ) යම් දැන්වීමක, නාම පුවරුවක, විස්තර පත්‍රිකාවක හෝ පත්‍රිකාවක හෝ වෙනත් ලිඛිත මාධ්‍යයක එකී පදය භාවිතා කිරීම හෝ හැඳින්වීම ඇතුළත් වේ.

## *IV වන කොටස*

*වැරදි හා දඬුවම්*

20. 7(1)වන උප වගන්තිය යටතේ ලියාපදිංචි වීමකින් තොරව දේශීය වෛද්‍ය ආයතනයක් පවත්වා ගෙන යන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හය(06) ක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

21. 10 (1) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි වීමකින් තොරව දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හය(06) ක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

22. මෙම ප්‍රඥප්තියේ 7(2) (ආ) ඡේදය, 8 (1) උප වගන්ති යටතේ පවරනු ලැබූ යම් සාමාන්‍ය හෝ විශේෂ බලයක් යටතේ ක්‍රියා කරන යම් අවසර ලත් නිලධාරියෙකුගේ කටයුතු වලට සාධාරණ හෝ යුක්ති සහගත හේතුවක් නොමැතිව අවනත නොවන හෝ බාධා කරන හෝ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත්, රුපියල් පන් දහසකට නොඅඩු රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

23. 17 (1) හා/හෝ (2) උප වගන්ති වල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන කවර හෝ තැනැත්තෙකු විසින් වරදක් සිදු කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ මාස 12 ක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

24. යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තියේ 10 (1) උපවගන්තිය යටතේ ලියාපදිංචි නොවී දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කරන්නෙකු, දේශීය වෛද්‍ය උපස්ථායකවරයෙකු හෝ දේශීය වෛද්‍ය සම්බාහකවරයෙකු හෝ වශයෙන්:-

(1) දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කරන්නා, දේශීය වෛද්‍ය උපස්ථායකවරයා, දේශීය වෛද්‍ය සම්බාහකවරයා යන පදවි නාමයන් ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඊට සමාන වෙනත් භාෂාවකින් තනිව හෝ වෙනත් වචන හෝ අක්ෂර හෝ සමඟ භාවිතා කිරීම, හෝ

(2) තමා ලියාපදිංචි දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කරන්නෙකු, ලියාපදිංචි දේශීය වෛද්‍ය උපස්ථායක වරයෙකු, හෝ ලියාපදිංචි දේශීය වෛද්‍ය සම්බාහකවරයෙකු ලෙස ව්‍යාංගයෙන් හැඟවෙන යම් නාමයක්, පදවි නාමයක්, එකතු කිරීමක් හෝ විස්තරයක් භාවිතා කිරීම හෝ

(3) දේශීය වෛද්‍ය ඖෂධ නිකුත් කරන්නෙකු ලෙස, දේශීය වෛද්‍ය උපස්ථායකවරයෙකු ලෙස හෝ දේශීය වෛද්‍ය පංචකර්ම ශිල්පියෙකු ලෙස හෝ සම්බාහකවරයෙකු ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටිමින් තම වාසිය තකා වෘත්තියෙහි නියැලීම හෝ ප්‍රතිකර්ම ලබා දීම හෝ

සිදුකරන යම් තැනැත්තෙකු වරදක් කරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත්, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

25. 19 (1) උප වගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් ලක්ෂදෙකක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

## *V* වන කොටස

### *පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලය*

පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලය

26. පළාත් දේශීය වෛද්‍ය සේවා සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් පත් කළ යුත්තේය.

පළාත් දේශීය වෛද්‍යඋපදේශක මණ්ඩලයේ සංයුතිය

27. (1) පළාත් දේශීය වෛද්‍ය සේවා උපදේශක මණ්ඩලය (මින් මතු උපදේශක මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන) පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) ලේකම් ;

(ආ) කොමසාරිස් ;

(ඇ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු ;

(ඈ) කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක තුන නියෝජනය වන පරිදි සුදුසුකම් ලත් රාජ්‍ය අංශයේ නොවන ප්‍රවීණ දේශීය වෛද්‍ය වෘත්තිකයන්/ වෛද්‍යවරුන් තිදෙනෙකු ;

(ඉ) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය හා ප්‍රජාව නියෝජනය වන පරිදි පත් කරනු ලබන විද්වත් වෘත්තිකයෙකු ;

(2) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් නිල බලයෙන් උපදේශක මණ්ඩලයේ සභාපති වන අතර, කොමසාරිස් එහි ලේකම් වේ.

(3) ඉහත (1) වන උපවගන්තියේ (අ), (ආ) හා (ඇ) ඡේද වල සඳහන් සාමාජිකයන් නිල බලයෙන් පත් වේ.

(4) (අ) උපදේශක මණ්ඩලයේ සාමාජිකයින්ගේ ධුරකාලය අවුරුදු තුනක් (03) ක් වන්නේය.

(ආ) ඉල්ලා අස්වීම, මිය යාම, විෂය භාර අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කිරීම නිසා කලින් ධුරය හිස් වුවහොත්, මිස සෑම පත් කළ සාමාජිකයෙකුම පත් කල දින සිටඅවුරුදු 03ක කාලයක් ධුරය දරන අතර නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු වන්නේ ය.

(ඇ) පත් කළ සාමාජිකයෙකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරයෙන් හිස් වන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයාගේ ඉතිරි වී ඇති ධුරකාලය සඳහා වෙනත් සුදුසු සාමාජිකයෙකු පත් කරනු ලැබිය යුත්තේ ය.

(5) 27(1) (ඇ), (ඉ) ඡේද යටතේ පත් කරන ලද සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවකදී ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

(6) 27(1) (ඇ), (ඉ) ඡේද යටතේ පත් කරන ලද සාමාජිකයෙකු, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් විය හැක්කේ ය.

(7) අවම වශයෙන් මාස තුනකට (03) වරක් උපදේශක මණ්ඩලය රැස් විය යුත්තේ ය.

(8) උපදේශක මණ්ඩලයේ ගණ පූරණය සාමාජිකයින් 04 දෙනෙකු විය යුත්තේය.

28. උපදේශක මණ්ඩලය වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා වෙත සුදුසු පරිදි නිරීක්ෂණ, නිර්දේශ, උපදේශ ඉදිරිපත් කිරීම, පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවා වැඩි දියුණු කිරීම, පළාතේ සෞඛ්‍ය තත්ත්වය සංවර්ධනය කිරීම යන කටයුතු පිළිබඳව වරින් වර නිර්දේශ හා/හෝ යෝජනා ඉදිරිපත් කිරීම එකී උපදේශක මණ්ඩලයේ කාර්යභාරය වන්නේ ය. උපදේශක මණ්ඩලයේ කාර්යභාරය

## *VI වන කොටස*

### *රෝහල් සංවර්ධන කමිටු*

29. (1) පළාත තුළ පිහිටි දේශීය වෛද්‍ය රෝහල්, දේශීය වෛද්‍ය මධ්‍යම බෙහෙත් ශාලා සහ වෙනත් දේශීය වෛද්‍ය ආයතන සඳහා රෝහල් සංවර්ධන කමිටු (මින් මතු "කමිටු" යනුවෙන් හඳුන්වනු ලබන) ලේකම් විසින් පත් කළ හැක්කේය. රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම හා ඒවායේ සංයුතිය

(2) ඉහත (1) උප වගන්තිය යටතේ පිහිටුවනු ලබන රෝහල් සංවර්ධන කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

(අ) අදාළ කොට්ඨාසයේ ප්‍රදේශීය ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු ;

(ආ) ආයතනය භාර වෛද්‍ය නිලධාරි ;

(ඇ) අදාළ ආයතනය පිහිටි ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයින් ;

(ඈ) ප්‍රදේශයේ සිටින ලියාපදිංචි දේශීය වෛද්‍යවරුන් ;

(ඉ) පූජ්‍ය පක්ෂ නියෝජනය කරන නියෝජිතයින් ;

(ඊ) රෝහල් සේවක මණ්ඩලයේ නියෝජිතයින් ;

(උ) ආයතනයේ සංවර්ධනය සඳහා ක්‍රියාකාරි දායකත්වයක් ලබාදිය හැකි වෙනත් පුද්ගලයින් ;

(3) ඉහත සඳහන් (ඇ) (ඈ) (ඉ) (උ) ඡේද වල සඳහන් නියෝජිතයින් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පත් කල යුතු අතර ඒ ඒ ඡේද ප්‍රකාර පත් කළ යුතු නියෝජිතයින් සංඛ්‍යාව ආයතනයේ වර්ගීකරණයට අනුව අමාත්‍යවරයා විසින් රීති මගින් තීරණය කළ යුත්තේය.

(4) රෝහල් කමිටුව විසින් නිර්දේශ කරනු ලබන කමිටු සාමාජිකයින් තිදෙනෙකු අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තෙකු මෙම කමිටුවේ සභාපති වන අතර ආයතනය භාර වෛද්‍ය නිලධාරි නිල බලයෙන් මෙම කමිටුවේ ලේකම් වන්නේය.

(5) (අ) මෙම කමිටුවේ නිල කාලය වසර දෙක(02) කි.

(ආ) ඉහත (2) උප වගන්තියේ (ඇ), (ඈ), (ඉ), (උ)ඡේද යටතේ විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පත් කරනු ලබන සාමාජිකයන්ගේ ධුර කාලය කවර හෝ හේතුවක් නිසා නියමිත දිනට පෙර හිස් වුවහොත්, එම හිස් වූ ධුරය සඳහා වෙනත් තැනැත්තෙකු එම ඡේද වල විධිවිධාන වලට යටත්ව පත්

කිරීම විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන සාමාජිකයෙකුට තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවූ ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය හැක්කේ ය.

(ඈ) පත් කරන ලද සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයාට ඇත. ඕනෑම පත් කළ සාමාජිකයෙකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීමට හිමිකම ඇත.

(ඈ) රෝහල් සංවර්ධන කමිටුවක ගණ පූරණය හතක් (07) විය යුත්තේ ය.

රෝහල් සංවර්ධන කමිටුවේ කාර්යයන්

30. 29 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ රෝහල් සංවර්ධන කමිටුවේ කාර්යයන් පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

(1) අදාළ ආයතනය සහ මහජනතාව අතර සම්බන්ධීකරණය ඇති කිරීම ;

(2) ආයතනික සංවර්ධනය හා සුබසාධන කටයුතු ඉටු කිරීම ;

(3) සේවාලාභීන් වෙත ආයතනය මගින් ගුණාත්මක සේවාවක් සැලසීමට දායක වීම.

31. (1) අදාළ කමිටුව, මසකට වරක් රැස්විය යුතු අතර කමිටු වාර්තාවේ පිටපත් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත හා කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) කමිටු සාමාජිකයෙකු හෝ ඔහුගේ/ඇයගේ කළත්‍රයා ඇතුළු පවුලේ කිසිවෙකු පළාතේ දේශීය වෛද්‍ය රෝහලක් සමඟ කිසිදු කොන්ත්‍රාත් හෝ සැපයීම් හෝ වෙනත් බැඳීම් ඇති කර නොගත යුත්තේ ය.

(3) ස්වකීය කාර්යය ඉටු කිරීමේදී, රෝහල් සංවර්ධන කමිටු සාමාජිකයින් තම කමිටු සාමාජිකත්වය මත රෝහල් කටයුතු සම්බන්ධයෙන් අයුතු බලපෑම් සිදු කිරීම නොකළ යුත්තේ ය.

## *VII වන කොටස*

### *පොදු විධිවිධාන*

අමාත්‍යවරයා විසින් රීති සෑදිය යුතු බව

32. (1) විෂයභාර අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සඳහා රීති සෑදීම කළ යුතු වන්නේ ය.

(අ) බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය ආයතන ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ විධිවිධාන ;

(ආ) බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම සඳහා වු ගාස්තු ;

(ඇ) යම් තැනැත්තෙකු යම් දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා උපයෝගී කර ගත යුතු පටිපාටිය ;

(ඈ) යම් තැනැත්තෙකු දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ;

(ඉ) බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය ආයතන ලෙස ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කළ යුතු ලිපි ලේඛන, ආකෘති පත්‍ර සහ අධිකරණයේ නඩු පැවරීම සඳහා උපයෝගී කරනු ලබන ආකෘති පත්‍ර ;

(ඊ) බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කළ යුතු ලිපි ලේඛන, ආකෘති පත්‍ර සහ අධිකරණයේ නඩු පැවරීම සඳහා උපයෝගී කරනු ලබන ආකෘති පත්‍ර ;

(උ) යම් තැනැත්තෙකු දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම සහ ඒ සඳහා දෙනු ලබන අවසරය බල පැවැත්වෙන කාල පරිච්ඡේදය ;

(ඌ) බස්නාහිර පළාත තුල දේශීය වෛද්‍ය ආයතන ලෙස ලියාපදිංචි කිරීම, ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම, ලියාපදිංචි කිරීම අලුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවන් ;

(එ) බස්නාහිර පළාත තුළ දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයෙකු ලෙස ලියාපදිංචි කිරීම, ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම, ලියාපදිංචි කිරීම අලුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාවන් ;

(ඒ) රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම සහ සංයුතිය තීරණය වීම ;

(ඔ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් ඕනෑම කරුණක් ;

(2) (1) උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එම රීතියේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුත්තේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ සෑම රීතියක් ම ඒ යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිදි එකී අනනුමැතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(5) යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

33. මෙම ප්‍රඥප්තිය යටතේ වන කාර්යයන්, කර්තව්‍යයන් හා බලතල, ලේකම්ගේ අධීක්ෂණයට සුපරීක්ෂණයට හා විධි විධානයන්ට යටත්ව කොමසාරිස් විසින් ඉටු කළ යුතු වේ. — ලේකම්ගේ කාර්ය භාරය

34. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

35. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි, — අර්ථ නිරූපණය

"පළාත" ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත ද ;

"පළාත් සභාව"යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ද ;

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා ද ;

"විෂයභාර අමාත්‍යවරයා"යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂය පැවරී ඇති අමාත්‍යවරයා ද ;

"ලේකම්"යන්නෙන් දේශීය වෛද්‍ය විෂයභාර පළාත් අමාත්‍යංශයේ ලේකම් ද ;

"කොමසාරිස්"යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව සඳහා පත් කර ඇති දේශීය වෛද්‍ය කොමසාරිස් ද ;

"තැනැත්තා" යන්නෙන් යම් පුද්ගලයෙකු, දේශීය වෛද්‍ය ආයතනයක් හෝ සමාගමක් ද ;

"දේශීය වෛද්‍ය"යන්නෙන් ශ්‍රී ලංකාවේ දේශීය පාරම්පරික වෙදකම, අෂ්ඨාංග ආයුර්වේද, සිද්ධ, යුනානි හෝ ශ්‍රී ලංකාව තුළ විධිමත් අනුමැතියක් ඇතිව පවත්වාගෙන යනු ලබන වෙනත් විදේශ රටක් විසින් පිළිගනු ලබන හෝ ජාත්‍යන්තර වශයෙන් විකල්ප වෛද්‍ය ක්‍රමයක් හෝ සම්පූරක වෛද්‍ය ක්‍රමයක් ලෙස සම්මත කර ඇති ස්වභාවික හා සාකල්‍ය සිද්ධාන්ත හා අනුගත ප්‍රතිකාර ක්‍රම, සුව කිරීමේ ශාස්ත්‍ර සෞඛ්‍ය සත්කාර ක්‍රමද ;

"දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන්" යන්නෙන් භෛෂජ්ජකවරුන්, උපස්ථායකවරුන් සහ පංචකර්ම ශිල්පීන්, සම්බාහනකරුවන් ද ;

"වෛද්‍ය වෘත්තිකයෙකු"යන්නෙන් ශ්‍රී ලංකාවේ දේශීය පාරම්පරික වෙදකම, අෂ්ඨාංග ආයුර්වේද, සිද්ධ, යුනානි හෝ ශ්‍රී ලංකාව තුළ විධිමත් අනුමැතියක් ඇතිව පවත්වාගෙන යනු ලබන වෙනත් විදේශ රටක් විසින් පිළිගනු ලබන හෝ ජාත්‍යන්තර වශයෙන් විකල්ප වෛද්‍ය ක්‍රමයක් හෝ සම්පූරක වෛද්‍ය ක්‍රමයක් ලෙස සම්මත කර ඇති ස්වාභාවික හා සාකල්‍ය සිද්ධාන්ත හා අනුගත ප්‍රතිකාර ක්‍රම, සුව කිරීමේ ශාස්ත්‍ර සෞඛ්‍ය සත්කාර ක්‍රම වල නියැලෙන්නා වූ යම් වෘත්තිකයෙකු ;

"වෛද්‍ය ආයතන"යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 7 වගන්තියේ (1) සහ (2) උප වගන්තිය ටතේ දක්වා ඇති පරිදි පළාතේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ රජයේ හා/හෝ පෞද්ගලික අංශයේ දේශීය වෛද්‍ය රෝහල්, බෙහෙත් ශාලා, ප්‍රතිකාර මධ්‍යස්ථාන, දේශීය වෛද්‍ය පංචකර්ම මධ්‍යස්ථාන, දේශිය වෛද්‍ය ශාරීරික සත්කාරක සේවා ආයතන, දේශීය වෛද්‍ය ඖෂධ හෝ උපකරණ අලෙවි කරන අලෙවි සැල්ද;

අදහස් කෙරේ.

12-102

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.